සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation - 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සංගීතය (පෙරදිග) | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

---

(01) විකෘති ස්වර දෙකක් පමණක් යෙදෙන නිර්දේශිත රාගය කුමක් ද?
(1) බිලාවල් (2) යමන් (3) භෛරවී (4) කාෆි

(02) නිර්දේශිත රාග අතුරෙන් විකෘති ස්වර 4 ක් හා විවාදී ස්වර 5 ක් යෙදෙන රාගය කුමක්ද?
(1) භෛරවී (2) යමන් (3) කාෆි (4) භූපාලි

(03) සංගීතයේ ප්‍රකෘති හා විකෘති ස්වර සංඛ්‍යාව පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) 2 , 5 (2) 2 , 4 (3) 7 , 5 (4) 7 , 4

(04) දිල්රුබාවට බෙහෙවින් සමාන තත්වාද්‍ය භාණ්ඩයකි,
(1) සිතාර් (2) එස්රාජ් (3) මැන්ඩලීන් (5) වයලින්

(05) රාගධාරී ශාස්ත්‍රීය ගායනා අංගයක් ඉදිරිපත් කිරීමේදී ශ්‍රැතිය පවත්වා ගැනීමට වඩාත් සුදුසු තන්ත්‍රීය භාණ්ඩය දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) සිතාරය (2) තාම්පුරාව (3) එස්රාජය (4) හාර්මෝනියම්

(06) නිර්දේශිත රාග දෙකක වාදී ස්වරය ගාන්ධාරය වන අතර, නිර්දේශිත එක් රාගයක එය සංවාදී ස්වරය වේ. එම රාග ත්‍රිත්වය දැක්වෙන පිළිතුර කුමක්ද?
(1) යමන්, භූපාලි, බිලාවල් (2) බිලාවල්, යමන්, භූපාලි
(3) කාෆි, බිලාවල්, යමන් (4) යමන්, භූපාලි, භෛරවී

**අංක 7 හා 8 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත දැක්වෙන ආරෝහණ අවරෝහණ ස්වර උපයෝගී කරගන්න.**
**ස රි ම ප නි සං , සං නි ධ ප ම ග රි ස**

(07) ඉහත දැක්වෙන ආකාරයට රාගයක ආරෝහණ, අවරෝහණ යෙදී ඇත්නම්, එම රාගයේ ජාතිය වන්නේ,
(1) ෂාඩව - සම්පූර්ණ (2) ෂාඩව - ෂාඩව (3) ඖඩව - සම්පූර්ණ (4) සම්පූර්ණ - සම්පූර්ණ

(08) ඉහත දැක්වෙන ආරෝහණ ස්වර බන්ධයේ දක්නට නොලැබෙන ස්වර නිර්දේශිත රාගයක වාදී, සංවාදී ස්වර වේ. එම රාගය කුමක්ද?
(1) භෛරවී (2) යමන් (3) කාෆි (4) භූපාලි

(09) රාග ගායන සමය පිළිබඳ කාලසටහන අනුව ප.ව. 6.00 - 9.00 අතර කාලය හඳුන්වන නාමය හා එම කාලයේ ගැයීමට සුදුසු රාගයක් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) රාත්‍රී ප්‍රථම ප්‍රහරය - යමන් (2) රාත්‍රී ප්‍රථම ප්‍රහරය - බිලාවල්

(3) රාත්‍රී දෙවන ප්‍රහරය - යමන් (4) රාත්‍රී දෙවන ප්‍රහරය - බිලාවල්

(10) කාෆි රාගයේ වාදි, සංවාදී, අනුවාදී, විවාදී යන ස්වර සියල්ල අන්තර්ගත ස්වර පාදය තෝරන්න.

(1) /රි ගු රි ම / ගු රි ස රි / ප - ප ම / ගු රි ස - /

(2) /ම ප නි නි / සං - නි සං / නි ධ ප ම / ගු රි ස - /

(3) /රි නි ධ නි / ප ධ ම ප / රි ගු රි ම / ගු රි ස - /

(4) /ස ස රි රි / ගු ගු ම ම / ප - ප ම / ගු රිස - /

(11) /ගුගු පධ සං- ධප / සංසං ධප ගුරි ස- /

ඉහත සඳහන් තානාලංකාරය

(1) බිලාවල් රාගයට අයත් සරල තානයකි. (2) බිලාවල් රාගයට අයත් මිශ්‍ර තානයකි.

(3) භූපාලි රාගයට අයත් සරල තානයකි. (4) භූපාලි රාගයට අයත් මිශ්‍ර තානයකි.

(12) නිර්දේශිත තාල තුනක බලිස්ථාන, තාලයේ 4,5,6 යන මාත්‍රා මත පිහිටයි. එම තාල තුන වන්නේ පිළිවෙළින්,


(1) බෙම්ටෝ, දාදරා, කෙහෙර්වා (2) දාදරා, ජප්තාල්, කෙහෙර්වා


(3) කෙහෙර්වා, ජප්තාල්, ත්‍රිතාල් (4) දාදරා, කෙහෙර්වා, ජප්තාල්

(13) විභාගයකට හිමි මාත්‍රා ගණන සමාන තාල යුගලයකි.

(1) දාදරා, බෙම්ටෝ (2) කෙහෙර්වා, ත්‍රිතාල්

(3) දීප්චන්දි, ජප්තාල් (4) කෙහෙර්වා, ජප්තාල්




(14) ඉහත A හා B රූප සටහන් මගින් හින්දුස්ථානී තාල දෙකක ආවර්ත දක්වා ඇත. එම තාල දෙක කුමක්ද?

(1) ලාවණි, ත්‍රිතාල් (2) කෙහෙර්වා, දීප්චන්දි

(3) ලාවණි, කෙහෙර්වා (4) කෙහෙර්වා, ත්‍රිතාල්

(15) ''මන්නාරම් පිටිවැල්ලේ...'' ''කව්රුදෝ අර කව්ලුවෙන්...'' යන ගීත දෙකේ තනු නිර්මාණ තුළ නිර්දේශිත රාග දෙකක ඡායාව දැකිය හැකිය. එම රාග දෙක කුමක්ද?


(1) බිලාවල්, භූපාලි (2) බිලාවල්, භෛරවී (3) භූපාලි, භෛරවී (4) භූපාලි, කාෆි

(16) භෛරවී රාගාශ්‍රිතව තනු නිර්මාණය වූ චිත්‍රපට ගීතයකි,

(1) තෙරේ මේරේ... (2) තූ ගංගා කී ...

(3) දුනියාකේ රඛවාලේ ... (4) ජනක ජනක පායල ...

**අංක 17 සිට 19 දක්වා ප්‍රශ්න වලට පහත දී ඇති ස්වර පුවරුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**




(17) ඉහත ස්වර පුවරුවේ අංක 1 හා 3 වාදී ස්වර වන රාග දෙක දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කාෆි, භූපාලි (2) බිලාවල්, භූපාලි (3) භෛරවී, කාෆි (4) බිලාවල්, කාෆි

(18) සංගීතයේ අචල ස්වර දැක්වෙන අංක සහිත පිළිතුර වන්නේ,

(1) 1, 8 (2) 3, 8 (3) 1, 7 (4) 7, 12

(19) යමන් රාගයේ යෙදෙන විකෘති ස්වරය දැක්වෙන අංකය සහිත පිළිතුර වන්නේ,

(1) 2 (2) 4 (3) 6 (4) 9

(20) මාත්‍රා 3/4 රිද්ම රටාවට අනුව ගැයෙන ගීතයකි,

(1) සසර වසන තුරු... (2) රන්වන් කරල් සැලේ ...

(3) ගුමු ගුමුව වදුලේ ... (4) ඇසේ මතුවන කඳුළු බිඳුගෙන ...


(21) 'දුල් නිමල් සිසි සේ දිසි...' යන ගීතය තුළ අන්තර්ගත සුවිශේෂී ගායන අංගය කුමක්ද?

(1) තානාලංකාර (2) උරුට්ටුව (3) දොහොරාව (4) ආලාප

(22) පහත ගීත අතුරෙන් නව නාට්‍ය ගීතය තෝරන්න.

(1) ප්‍රේමයෙන් මන රන්ජිත වේ... (2) ඒ බුදුබව පතමින ලොබිනේ...

(3) යානත අතුල මල්පෙති ... (4) සවන් දී පෙර රාම චරිතේ ...

(23) 

ඉහත දැක්වෙන Key Signature (කී සිග්නේචරය) අයත් Scale (ස්කේලය) කුමක්ද?

(1) F Major (2) C Minor (3) G Major (4) G Minor

(24) සේ ගීයකට උදාහරණයකි,

(1) රන් දෑ කැති ගෙන... (2) බාල ළමාවරු...

(3) ඉහල වෙලේ තියෙන ... (4) ලක්ෂ්මී බුජවාසා...

(25) සබරගමු වන්නමක කොටස් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) දවුල් පදය, තානම, කවිය, කලාසම, අඩව්ව

(2) බෙරපදය, තානම, කවිය, කලාසම, ඉරට්ටිය

(3) දවුල් පදය, තානම, කවිය, කස්තිරම, අඩව්ව

(4) බෙරපදය, තානම, කවිය, කස්තිරම, අඩව්ව

(26) /ස - රි / ග - ම / ග - - / ස - - /

ඉහත ස්වර පාදය හා සුසංගත (Harmony) වන ස්වර පාදය දැක්වෙන පිළිතුර වන්නේ,

(1) / ස - ග / ම - ධ / ප - - / ග - -/ (2) /රි - ග / ම - ප/ ම - - /රි - -/

(3) /ග - ම/ ප - ධ/ ප - - /ග - - / (4) /ප - ධ / නි - ස් / ම - - / රි - -/

(27) ''වෙල්යායෙන් හමන සුළං වෙහෙස නිවන්නේ ....''

ඉහත දැක්වෙන ගී පාදයේ,

(1) ලඝු අක්ෂර 11 ගුරු අක්ෂර 04 කි. (2) ලඝු අක්ෂර 10 ගුරු අක්ෂර 05 කි.

(3) ලඝු අක්ෂර 08 ගුරු අක්ෂර 06 කි. (4) ලඝු අක්ෂර 08 ගුරු අක්ෂර 05 කි.

(28) ප්‍රාග්, ජුපිටර් වැනි සිම්ෆනි නිර්මාණය කළ සංගීතඥයා වන්නේ,

(1) බිතෝවන් (2) මෝසාර්ට් (3) යානි (4) රහ්මාන්


**/ග ම ප / ග ම රි / ස රි ග / ම ප - /**

(29) ඉහත ස්වර මධ්‍යම භාවයෙන් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) /ධ <u>නි</u> ස් / ධ <u>නි</u> ප / ම ප ධ / <u>නි</u> ස් - / (2) /ධ නි ස් / ධ <u>නි</u> ප / ම ප ධ / නි ස් - /

(3) /ප ධ නි / ප ධ ප / ග ම ප / ධ ස් - / (4) /ප ධ <u>නි</u> / ප ධ ප / ම ප ධ / <u>නි</u> ස් - /

(30)




ඉහත 'a' ධ්වනි තරංගයෙන් මධ්‍ය 'ස' ස්වරය නිරූපණය වේ නම් 'b' ධ්වනි තරංගයෙන් නිරූපණය වන ස්වරය වන්නේ,

(1) මන්ද්‍ර ස (2) මධ්‍ය රි (3) මධ්‍ය ප (4) උච්ච ස

(31) 'ගම්භිර කාලිංග නුවර...' මෙම ගී පාදය ගැයිමේදී සහාය වාදනයට යොදගතහැකි අවනද්ධ වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) ගැටබෙරයයි. (2) පහතරට බෙරයයි. (3) දවුලයි. (4) මද්දලයයි.

(32) ෂඩ්ජය හා මධ්‍යමය අතර සංඛ්‍යාතයන්හි අනුපාතය 3:4 කි. ෂඩ්ජයේ සංඛ්‍යාතය 240 නම් මධ්‍යමයේ සංඛ්‍යාතය කීයද?

(1) 320 (2) 340 (3) 350 (4) 360

(33) සරල බස් වහර හා සරල තනුවකින් යුතු, සංගීතයට වඩා කටහඬට ප්‍රමුඛස්ථානයක් ලබා දුන් ගීතයක් වන්නේ,

(1) ආදරයේ උල්පත වූ අම්මා.... (2) එන්නද මැණිකේ මමත් දියඹටා ...

(3) සිරි බුද්ධගයා විහාරේ ... (4) දසබලධාරී බුදු රජු පෙර කළ ...

(34) ''වෙසක් කැකුළු අතු අග හිඳ නටන විලාසේ ....''

ඉහත ගීතය හා සැසඳෙන ප්‍රකාශය වන්නේ,


(1) දේශීය ගැමි ගී තනු ඇසුරෙන් නිර්මාණය කළ ගීතයකි.

(2) හින්දුස්ථානි සංගීතය ඇසුරෙන් තනු නිර්මාණය කළ ගීතයකි.

(3) දේශීය චිත්‍රපට ගීත කලාවේ ස්වාධීනත්වය සනිටුහන් කළ නිර්මාණයක ඇතුළත් ගීතයකි.

(4) ලාංකේය තැටි ගීත කලාවේ ආරම්භගත යුගයේ තැටිගත කළ ගීතයකි.

(35)




ඉහත 1 හා 2 රූප සටහන් මගින් පිළිඹිබුවන Major Chaords වන්නේ පිළිවෙළින්,

(1) C , F (2) G , F (3) F , G (4) C , G

(36) 'සිනිඳු සුදු මුතු තලාවේ...' ගීතය හා සම්බන්ධ නිවැරදි කරුණු අන්තර්ගත පිළිතුර තෝරන්න.

(1) බටහිර සංධ්වනි ආභාෂය - ඒකාකාරී තාලය - දීර්ඝ පදමාලාව.

(2) හින්දුස්ථානි සංගීත ශෛලිය - ඒකාකාරී තාලය - දීර්ඝ පදමාලාව.

(3) විවිධ සංගීත භාණ්ඩ යොදාගත් වාද්‍ය සංගීතය - විවිධතාල - කෙටි පද මාලාව.

(4) ජන සංගීත ශෛලිය - සරල තාල - කෙටි පද මාලාව.

**37 සිට 39 දක්වා ප්‍රශ්න වලට පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| A | B | C | D | E | F |
|---|---|---|---|---|---|
| පිපී පිපී රේණු නටන | උන්මාද සිතුවම් | කුල ගෙදරින් | බන්දුල විජේවීර මහතා | නාරද දිසාසේකර මහතා | ගුණදාස කපුගේ මහතා |

(37) හුලවාලි චිත්‍රපටයේ ගීතයක් හා එය ගයන ගායකයා දැක්වෙන අක්ෂර වන්නේ,

(1) A, D (2) B , F (3) C , D (4) C , E

(38) මහාචාර්ය සුනිල් ආරියරත්නයන් රචනා කළ, සරත් දසනායකයන් තනු නිර්මාණය කළ ගීතයක් හා එය ගයන ගායකයා දැක්වෙන අක්ෂර වන්නේ,

(1) A, E (2) B , E (3) C , D (4) B , F

(39) 'A' අක්ෂරයෙන් දැක්වෙන ගීතය ඇතුළත් චිත්‍රපටය කුමක්ද?

(1) රන්මුතු දූව (2) ගැටවරයෝ (3) හුලවාලි (4) එක්ටැම්ගේ

(40) Multi Track Recording (මල්ටි ට්‍රැක් රෙකෝඩින්) යනු,

(1) ගායනය හා වාදනය පමණක් පටිගත කිරීමය.

(2) වාදනය පටිගත කර ගායනය සජීවීව ඉදිරිපත් කිරීමය.

(3) විවිධ සංගීත භාණ්ඩ එකවර වාදනය කර පටිගත කිරීමය.

(4) එක් එක් භාණ්ඩයෙන් නිකුත්වන සංගීතය වෙන් වෙන්ව පටිගත කිරීමය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation - 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 11 | විෂයය / பாடம் / Subject } පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper } II | කාලය / காலம் / Time } පැය 02 |

සැලකිය යුතුයි:

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

(01) අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) නි රි ස , නි රි ග රි ස , .......... මෙම ස්වර අභ්‍යාසය අයත් රාගයට අනුව එහි ඊළඟ පියවරට අදාල ස්වර ලියන්න.

(ii) හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය නම් කරන්න.

(iii) "ඇත ගව් ගණන් දුරින්..." යන ගී පාදය ගායනයේදී වැයීමට සුදුසු හින්දුස්ථානී තාලය නම් කරන්න.

(iv) 'ඇදුරුතුමා වන්න මගේ ...' මෙම ගීතය ඇතුළත් නාට්‍යය කුමක්ද?

- අංක (v) සිට (viii) තෙක් හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(v) ''කුස පබාවතී'' නාට්‍යයේ සංගීතය නිර්මාණය කළේ ............................... මහතාය.

(vi) ''මෑ වේ මා දුටු කොමල ලියා....'' ගීතය ඇතුළත් වන්නේ ................................ නාට්‍යයේය.

(vii) ''ගමට කලින් හිරු මුළුතැන්ගෙට .....'' ගීතයේ තනු නිර්මාණය කළේ ...............................
.............................. මහතාය.

(viii) සබරගමු සම්ප්‍රදායට අයත් .................................. වන්නම තිත් රූප දෙකකට ගැයේ.

- අංක (ix) හා (x) හි හිස්තැන් සඳහා සුදුසුම පිළිතුරු වරහන් තුළින් තෝරා ප්‍රශ්න අංකයද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

**(ජයලත් මනෝරත්න, W.B. මකුලොලුව, ලයනල් රන්වල, රෝහණ බැද්දගේ)**

(ix) ජන සංගීතය ඇසුරෙන් තනු නිර්මාණය වූ ''මල්සරා බැල්ම හෙළා...'' ගීතය ගයන .................................. මහතා, ..................................... මහතාගේ අන්දරේලා නාට්‍යයේ සංගීත නිර්මාණය කොට ඇත.

(x) ''වන්නම් සවුදම් ගායන..'' ගීතය ගයන ...................................... මහතා ..................................... මහතාගේ ''දෙපානෝ'' ගීත නාට්‍යයටද රංගනයෙන් දායක වී ඇත.

(02) පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග දෙකකට අයත් තොරතුරු දෙකකි.

A - ශුද්ධ ස්වර සහිත සම්පූර්ණ ජාති රාගයකි.

B - ස්වර දෙකක් වර්ජ්‍ය වන ශුද්ධ ස්වර සහිත රාගයකි.

(i) ඉහත A හා B අක්ෂර යටතේ දැක්වෙන ප්‍රකාශ තුළින් පිළිබිඹු වන රාග දෙක පිළිවෙළින් නම් කරන්න.

(ii) එම රාග දෙකෙන් එක් රාගයක මධ්‍යලය ගීතයක ස්ථායි, අන්තරා කොටස් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. නැතහොත් වාදිතයක ස්ථායි, අන්තරා කොටස් ප්‍රස්තාර කර ඊට උචිත මාත්‍රා 8 කට නොඅඩු තානාලංකාර දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කරන්න.

(iii) ඉහත රාග දෙකට අදාලව පහත වගුවේ අසා ඇති තොරතුරු සපයන්න.

| | ථාථය | ගායන සමය | රාග සංගති |
|---|---|---|---|
| A රාගය | a) ...................... | b) ...................... | c) ......................<br>d) ...................... |
| B රාගය | e) ...................... | f) ...................... | g) ......................<br>h) ...................... |

(03) A - / ස ස රි රි / ග ග ම ම / ප - - ම / ප ධ නි සṡ /

B - / ම ග රි / ස රි නි̣ / ස - ධ̣ / නි̣ ස - /

C - / නි ධ - ප / ම ප ග ම / ප - - - / ප ම ග රි /

ඉහත A, B, C අක්ෂර යටතේ දැක්වෙන්නේ නිර්දේශිත රාග තුනක විකෘති ස්වර සටහන් නොකළ සර්ගම් පාද තුනකි.

(i) එම අක්ෂර ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා එක් එක් රාගයට අදාලව විකෘති ස්වර සටහන් කොට, ස්වර පාදය නැවත නිවැරදිව ලියන්න.

(ii) එම ස්වර පාද අයත් රාග තුනේ නම් ලියන්න.

(iii) A හා B අක්ෂර යටතේ දැක්වෙන රාග දෙක ඇසුරෙන් තනු නිර්මාණය වූ නූර්ති ගී දෙකක මුල් පාද ලියන්න.

(iv) "C" අක්ෂරය යටතේ දක්වා ඇති රාගයේ මුඛ්‍යාංගය ලියන්න.

(04) (i) ජන ගී වර්ගීකරණය අනුව ගැමි ගී නිර්මාණයට පදනම් වූ මූලික කරුණු තුන ලියන්න.

(ii) පහත දැක්වෙන ගැමි ගී එම කොටස් තුනට අනුව වෙන්කොට ලියන්න.

a) බුද්ධං සරණේ සිරස දරාගෙන ...

b) කළුවන් කළුරුවයි මංගෝ දිලිසෙනවා ...

c) ඔලිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ ...

d) නුඹේ අම්මා කිරට ගියා ...

e) තණ්ඩලේ දෙන්නා දෙපොලේ ...

f) පෙරයම බුද්ධං සරණේ ගඤ්ඤයි ...

(iii) ගැමි ගී සේ ගී අතර වෙනස්කම් දෙකක් ලියන්න.

(iv) සබරගමු වන්නමක හෝ පහතරට සින්දු වන්නමක තානම පද ප්‍රස්තාර කරන්න.

(05) (i) හින්දුස්ථානි තාල ඇසුරින් පහත දක්වා ඇති අසම්පූර්ණ වගුව සම්පූර්ණ කරන්න.

| තාලය | මාත්‍රා | විභාග | බලි ස්ථාන | සමාන දේශීය තිත |
|---|---|---|---|---|
| දාදරා තාලය | a)................ | 2 | 1 | b)................. |
| c).................. | 8 | d)................. | 1 | මහ තනි තිත |
| ජප් තාලය | e)................ | 4 | 1 | f)................. |
| දීප්චන්දි තාලය | g)................ | 4 | 1 | h)................. |
| i)................... | j)................. | 4 | 1 | මහ තනි තිත |

(ii) විභාගයකට මාත්‍රා 4 බැගින් යුත්, විභාග 4 කින් සමන්විත තාලයක ඨේකාව නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

(iii) පහත දැක්වෙන ඨේකාවන්හි හිස්තැන් පුරවා නැවත ලියන්න.

A)

| | | | | |
|---|---|---|---|---|
| මාත්‍රා | 1 2 | 3 4 5 | 6 7 | 8 9 10 |
| ඨේකාව | - - | ධි ධි න | - - | ධි ධි න |
| තාල සංඥා | x | 2 | 0 | 3 |

B)

| | | |
|---|---|---|
| මාත්‍රා | 1 2 3 4 | 5 6 7 8 |
| ඨේකාව | - - න ති | න ක - - |
| තාල සංඥා | x | 0 |

(06) (i) පහත සඳහන් වන්නේ සොකරි, කෝලම්, නාඩගම්, හා නූර්ති යන රංග සම්ප්‍රදායයන් 4 කට අදාල තොරතුරු කිහිපයකි. එම රංග සම්ප්‍රදායයන්ගේ නම් ලියා එක් එක් කරුණු අදාල රංග සම්ප්‍රදාය යටත් ගොනු කරන්න.

★ කමත රංග භූමිය වේ.

★ කරලිය.

★ සෑම චරිතයක්ම වෙස්මුහුණු පළඳියි.

★ තානායම් පොළ.

★ රකිනු ඊශ්වරා.

★ උරුට්ටුව නම් ගීතාංගය ඇතුළත් වේ.

★ රංග ශාලාවක් තුළ වේදිකා ගත වේ.

★ ගම්භිර කාලිංග නුවර නිරිඳුගෙ...

★ වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ...

★ ගීත වල ස්ථායි, අන්තරා, ආකෘතිය ඇත.

★ පායාලා අඹරේ...

★ පරයා, ආඬිගුරු, වෙදරාල චරිත ඇත.

(ii) එක් එක් රංග සම්ප්‍රදායයේ භාවිතා කරන අවනද්ධ භාණ්ඩය අදාල රංග සම්ප්‍රදායයේ නාමය යටතේ ලියන්න.

(iii) ලාංකේය නාට්‍ය ගීත 4 ක් දැක්වෙන පහත සඳහන් වගුවේ හිස්තැන් පුරවන්න.

| ගීත | නාට්‍යයේ නම |
|---|---|
| • නෙයිනගෙ සූදුව (පළමුව මම වැන්දා බුදුන්) | a) ........................................... |
| • කුමටද සොබනියෙ ........... | b) ........................................... |
| • හනික වරෙව් කොල්ලනේ .... | c) ........................................... |
| • හෙළ ගැඹුරුයි .... | d) ........................................... |

(07) පහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාරය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ඉහත ප්‍රස්තාරයේ Time Signature ලියා දක්වන්න.

(ii) ඉහත සඳහන් අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කරන්න.

(iii) ඉහත ප්‍රස්තාරයේ පළමු විභාග 4 ට ගැලපෙන Chords ලියන්න.

(iv) එම ප්‍රස්තාරයේ a, b, c අක්ෂර යටතේ දැක්වෙන සංකේත නම් කරන්න.